# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1076 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 29/06/2024<br>පැය 2030 |

## මාධ්‍ය නිවේදනය

### මත්ද්‍රව්‍ය විනාශ කිරීම - පොලිස් මූලස්ථානය.

ශ්‍රී ලංකාව මතින් තොර නිදහස් සුරක්ෂිත දේශයක් කිරීමේ උදාරතර සංකල්පය මත ශ්‍රී ලංකා පොලිසිය, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය, පොලිස් විශේෂ කාර්ය බලකාය හා නාවික හමුදාව විසින් දිගින් දිගටම මත්ද්‍රව්‍ය වැටලීම් සිදුකර සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට කටයුතු සිදු කරනු ලබයි. එසේ අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් සන්තකයේ තිබී සොයා ගන්නා ලද මත්ද්‍රව්‍ය තොග විනාශ කිරීම සඳහා පුත්තලම වනාතවිල්ලුව ලැක්ටෝස් වත්තේ අධිබලැති උදුනක් ස්ථාපිත කරන ලදි. මෙම ඉදිකරන ලද අධිබලැති උදුනේ ප්‍රථම වරට මත්ද්‍රව්‍ය තොගයක් විනාශ කිරීම 2024.05.18 වන දින ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදි.

ඒ අනුව 2020.04.01 වන දින මත්ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් නාවික හමුදා නිලධාරීන් සමඟ එක්ව ගැඹුරු මුහුදේ දී අත්අඩංගුවට ගත් පාකිස්තානු ජාතිකයන් 09 දෙනා සන්තකයේ තිබූ අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 614 ග්‍රෑම් 36 ක්, ප්‍රථමවරට ශ්‍රී ලංකාවෙන් හඳුනා ගන්නා ලද කෙටමින් මත්ද්‍රව්‍ය කිලෝ 581 ග්‍රෑම් 34 ක ප්‍රමාණය හා 2019.11.22 වන දින මත්ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් විසින් සිදු කරන ලද වැටලීමකදී සැකකරුවන් දෙදෙනෙකු සනත්කයේ තිබී අත්අඩංගුවට ගත් හෙරොයින් කිලෝ 13 ග්‍රෑම් 686 ක ප්‍රමාණය විනාශ කිරීම සඳහා 2024.06.29 වන දින උදෑසන කොළඹ මහ අධිකරණයේදී මත්ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් විසින් භාර ගන්නා ලදි. අනතුරුව පොලිස් විශේෂ කාර්ය බලකායේ ආරක්ෂාව යටතේ පුත්තලම ලැක්ටෝස් වත්ත වෙත රැගෙන යන ලද අතර එම මත්ද්‍රව්‍ය වල වටිනාකම මුදල් රුපියල් කෝටි 650 ක් පමණ වේ.

අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 614 ග්‍රෑම් 36 ක ප්‍රමාණය අද දින විනාශ කිරීමට කටයුතු කරන ලද අතර ඉතිරි මත්ද්‍රව්‍ය තොගය 2024.06.30 වන දින විනාශ කිරීමට නියමිතය.

මෙම මත්ද්‍රව්‍ය විනාශ කිරීම විනිවිද භාවයකින් යුතුව සිදු කිරීමට කටයුතු කරන අතර ඒ සඳහා අධිකරණ විනිසුරුවරු, අන්තරායකර ඖෂධ ජාතික පාලක මණ්ඩලයේ නියෝජිතයින්, රජයේ රස පරීක්ෂක, මාධ්‍යවේදීන් හා මත්ද්‍රව්‍ය නිවාරණ කාර්යංශ නිලධාරීන් සහභාගී විය.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**